ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

12

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 9th March 20..

පැමිණිලි පාර්ශවය : කේ.ඩී සුනීතා මිය,
25/13 ජී, ජර්මන් වත්ත,
පැපිලියවල.

වගඋත්තර පාර්ශවය : 01. කොමසාරිස්,
නිවාස ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
2 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

02. ලේකම්,
නිවාස ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
2 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පැමිණිලි අංකය : **HRC/1531/15**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 1974 අංක 34 දරණ නිවාස දෙපාර්තමේන්තු උපරිමය පිළිබඳ නීතියෙන් සංශෝධිත පරිදි 1973 අංක 01 දරණ නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතියේ 20 වන වගන්තිය යටතේ 1973 නොවැම්බර් මස සිට රජයට පවරාගත් සිය දේපළ වෙනුවෙන් මේ වන තුරු කිසිදු වන්දි මුදලක් ලබා දීමට කටයුතු නොකිරීම තුළින් තමාට අසාධාරණයක් සිදුවූ බවයි.

තවද මූලික ගැටළුව වශයෙන් පැමිණිලිකාරිය සඳහන් කර ඇත්තේ, වගඋත්තරකාර ආයතනය මගින් වන්දි මුදලෙහි ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා තක්සේරු මණ්ඩලයක් පත්කිරීම සිදුකළ යුතු වුවත් පත්කර නොමැති බවයි. අදාළ තක්සේරු මණ්ඩලය පත්කිරීමේ පූර්ණ බලය ඇත්තේ වගඋත්තරකාර ආයතනය නියෝජනය කරන විෂය භාර අමාත්‍යවරයාට වන නමුත්, මෙතෙක් තක්සේරු මණ්ඩලය පත් නොකිරීම තුළින් වසර 40 ක පමණ කාලයක් ගතවුවද පවරාගත් දේපල සම්බන්ධයෙන් තමන්ට වන්දි ලබාගැනීමට මේ වන තුරු හැකියාවක් නොලැබුනු බවයි.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඒ අනුව කඩිනමින් තක්සේරු මණ්ඩලය පත්කර තමන්ගෙන් පවරාගත් දේපල වලට සාධාරණ වන්දි මුදලක් ලබා දෙන ලෙසට වගඋත්තර පාර්ශවය වෙත නිර්දේශ නිකුත් කරන ලෙසට පැමිණිලිලෙන් ඉල්ලා ඇත.

වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-

1973 අංක 01 දරණ නිවාස දේපල හා උපරිම නීතිය යටතේ ජාතික නිවාස කොමසාරිස් විසින් පවරාගත් දේපල වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා වන්දි මණ්ඩයක් පනත ප්‍රකාරව පිහිටවිය යුතු බවත්, ඒ සඳහා ජාතික නිවාස කොමසාරිස්වරයාගේ ඉල්ලීම මත අමාත්‍යාංශ ලේකම්වරයා විසින් විෂයභාර අමාත්‍යවරයා වෙත දැනුම්දීමෙන් අනතුරුව අමාත්‍යවරයා විසින් අදාළ පත්කිරීම සිදුකරනු ලබන බවත් සඳහන් කර ඇත. මේ වන විට ජාතික නිවාස කොමසාරිස් ධූරයේ ස්ථිර නිලධාරියෙකු රාජකාරී නොකරන අතර, කාලයෙන් කාලයට අමාත්‍ය මණ්ඩල තීරණ මත ජාතික නිවාස කොමසාරිස්වරයෙකු පත්කිරීම හේතුවෙන් තක්සේරු මණ්ඩලය සඳහා අවම වශයෙන් සාමාජිකයින් තුන් දෙනෙකුගෙන් යුතු මණ්ඩලයක් පිහිටුවීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව තක්සේරු නිලධාරියෙකු මෙම තක්සේරු මණ්ඩලයේ අත්‍යාවශ්‍ය සාමාජිකයෙකු වන බැවින්, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු නිලධාරියෙකු ඒ සඳහා පත්කිරීමට ඇති බව වගඋත්තරකරු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. අදාළ නිර්දේශ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති බවත් අදාළ මණ්ඩලය පිහිටුවීමට අවශ්‍ය කටයුතු හැකි ඉක්මනින් සිදුකිරිමට කටයුතු කරමින් සිටින බවත් වගඋත්තරකරුවන් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

නිරීක්ෂණ :-

සේදවත්ත පාර, වැල්ලම්පිටිය යන ලිපිනයට අදාළ පනත වරිපනම් අංක වලට අයත් දේපළ 1974 වර්ෂයේදී පැමිණිලිකාරියගෙන් පවරාගෙන ඇති අතර, අදාළ වරිපනම් අංක 43/ඩී.1, 43/ඊ.1, 43/ඊ.2, 43/ඊ.3, 43/ඊ.4, 43/ඊ.5, 43/1, 43/3, 43/4, 43/5, 17, 19, 21, 16/ඒ, 22, 22/3/ඒ, 1.22/4ඒ, 22/ඒ.7 සහ 22/8 ලෙස වේ. වසර 40 ක පමණ කාලයක් ගතව ඇතත්, මේ වනතුරු පැමිණිලිකාරියට පවරාගත් දේපල සම්බන්ධයෙන් වන්දි ප්‍රධානය නොකිරීම ගැටළුවක් වන බව නිරීක්ෂණය වේ. අදාළ වන්දි තක්සේරු මණ්ඩලය පත්කිරීම දිනෙන් දින ප්‍රමාද කිරීම හේතුවෙන් මෙම අසාධාරණය සිදුව ඇති බවද එබැවින්, වන්දි තක්සේරු කිරීමේදී වර්ථමාන වෙළඳපොල වටිනාකම අනුව පැමිණිලිකරුගේ වන්දි මුදල තක්සේරු කිරීම සුදුසු බව නිරීක්ෂණය වේ. එසේම, අදාළ වන්දි තක්සේරු මණ්ඩලය පත්කිරීම වගඋත්තරකරු ප්‍රමාද කර ඇති බවත්, මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලබයි.

නිගමනය :-

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය තුළ අන්තර්ගත මූලික අයිතිවාසිකම් අතරින් එක් අයිතිවාසිකමක් වන 12 වන ව්‍යවස්ථාව මඟින් හඳුන්වා දී ඇති සමානාත්මතාවයේ අයිතිවාසිකම වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය තුළින් උල්ලංඝනය වී ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව නීතිය සහ

නීතිය ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණයද සර්ව සාධාරණ ලෙස ලබාගැනීමට ඇති අයිතිය මෙම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇත. මෙම අයිතිය අනුව කිසිම පුරවැසියෙකුට වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂභාවය, දේශපාලන මතය හා උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂත්වයකට භාජනය නොකළ යුතුය. මෙම අයිතිය විශේෂයෙන්ම කරුණු 02 ක් යටතේ විග්‍රහ කළ හැකිය.

1. සියළු දෙනාම නීතිය ඉදිරියේ සමානය (All person are equal before the low)
2. නීතියේ රැකවරණයේදී සියලු දෙනාටම සමාන අයිතියක් ඇත. (Entitled to the equal protection of the law)

ඒ අනුව, සමස්ත කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී වගඋත්තරකරුගේ ක්‍රියාකලාපය තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වන ව්‍යවස්ථාව ප්‍රකාරව සුරක්ෂිත කරන ලද්දා වූ පැමිණිලිකාරිය සතු අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

කඩිනමින් තක්සේරු මණ්ඩලය පත්කර වර්තමාන වෙළඳපොල වටිනාකම අනුව අදාළ වන්දි මුදල පැමිණිලිකාරියට ලබාදීම සුදුසුබව නිර්දේශ කරනු ලැබේ.

2021. 05.03 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත මෙයින් දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmugan

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

3/03

ම.හේ. නිමල් කරුණාසිරි
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

B/